

දෙවිතුමන්ගේ
විස්මපත් කරුණාව

# දෙවිතුමන්ගේ විස්මපත් කරුණාව



මම වයස, අවුරුදු 14 වන විට, බෙබද්දෙක්ව, සුරාදූර්තයෙක්ව, කිරීමට හැකි සියලු ආකාර අවකල් ක්‍රියාවන්හි දී සිටියෙමි. තේ හැන්දකින් විස්කි තොල්ගාන්ට, පටන්ගත් මම අවසන් වුයේ ගැලුම් 5ක කෑනයකින් මෙන්ය! නිසි කිතුණු විනයක් සහා ශික්ෂණයක් නොමැතිව, මා සහ මාගේ සහෝදරයා වැඩුණේ වන මෘගයන් මෙනි. ‘මේ ලෝකේ අධිපතියා,’ සාතන් මගේ දෑස් අන්ධකර බැවින්, මා ජීවත් වුයේ කාලකන්ණි, ආත්මාර්ථකාමී, අභක්තික, විනාශකාරී දිවියකි.

‘මනුෂ්‍යයෙකුට හරිව පෙනෙන මාර්ගයක් ඇත; එහෙත් එහි කෙළවරෙහි මරණයේ මාර්ග තිබේ.’



වයස අවුරුදු 31 දී , මා පාපයේ උච්චතම අවස්ථාවට පැමිණියෙමි. දිනක් මා, හොඳටම වෙරිවී, මධ්‍යම රාත්‍රියේ නිවසට පැමිණ, මගේ නිවැසියන් සමග වාද කරන්නට විය. ඔවුන් මට තර්ජනය කළ බැවින් මා භීතියට පත්වීමි. ‘සොරකම් කිරීමටත්, මරන්ටත්, විණාශකිරිමටත්,’ පැමිණෙන යක්ෂයා, මට ඔවුන් තිදෙනාවම, මගේ 38 කැලිබර් පිස්තෝලයෙන් ඝාතනය කිරීමට පෙළඹවනු ලැබුවා. ඔවුන්ව ඝාතනය කිරීමෙන් අනතුරුව මටද වෙඩි තබාගන්නට කියා සාතන් කියනු


ලැබුවා.  එම නිසා මම මට පස්වතාවක් වෙඩිතියා ගත්තාය: බඩට දෙවතාවක්, එක එක වතාව බැගින් පෙනහළු දෙකට, ඉන්පසු හිස තුළිට එක වතාවක්.
හදිස්සියේම,  මහත් ආලෝකයක් මා වටා බැබෙළමින්, මහත් සැඩසුළඟක්, මා කරා හමනවා මට ඇසුණි.  රුපවාහිනී තිරයකින්මෙන්, ළමා අවදියේ සිට මා කළ සෑම පාපයක්ම දේව ආත්මයන්වහන්සේ මට එළිදරව් කරන්නට විය. ‘පාපයේ කුලිය නම් මරණයයි,’ මම නිරය කරා ගමන් කරමින් සිටින අතරමංවූ පව්කරුවෙක් බව මට වැටහීගියෙහිය. නිරාගින්න මගේ ආත්මයෙහි දැවෙනා ආකාරය මට හැඟින: එවිට ආත්මයාණන්වහන්ස පැවසීය:



“ස්වාමින්වහන්සේගේ නාමයට යාඥා කරණ කව්රු නුමුත් ගළවනු ලබන්නේය.”
දුම්ගසන පිස්තෝලය අතැතිව, මුළු ශරීරයෙන් මා ලේ ගලමින් තිබියදී:  ‘ස්වාමිවූ යේසුස්වාහන්ස, මා ගැළවුව මැනව!’ කියා මොරගසමින්, රාත්‍රී කාලය වෙතට මා වැටෙමින් ඇවිදින්නට විය.


සැනෙකින්: අසාමාන්‍ය දෙයක් සිදුවන්නට විය, එනම් දෙවිතුමන්ගේ දූතයන් සහා නපුරු බලවේගයන්  අතරේ යුද්ධයක් සිදුවෙන බව මට හොඳින් දැනිණ. බේබදුකමේ, දුම්බිමේ, වෛශ්‍යයාකමේ, දේවාඅපහසකිරීමේ යනාදී අපිරිසිදු ආත්මයන් පහකරමින්, දේවාත්මයාණන්වහන්සේ

මා මතට දැල්වෙන ගිනනක්මෙන් බැස ආසේක. යේසුතුමන්ගේ ලේ මේ සියලු පාපවලින් මා සේදූ සේක. ඉමහත්වූ සමාදානය සහ ප්‍රීතිය මා හදෙහි දෝරගලන්නට විය. යක්ෂයාගේ බලයෙන් නැවතත් වහල්කරනොගන්නා ලෙස, මා දේව දරුවෙක් ලෙස 'නැවත උපත' ලබා ඇත. ඉන් අනතුරුව, යේසුතුමාණන් මා ශුද්ධආත්මයෙන් පිරවුසේක, ස්වර්ගීය ප්‍රශංසාව අලුත් අන්‍යභාෂාවකින් මාගේ මුඛයෙන් ගලා යන්නට විය! තවමත් ඒ තුවාල සමග වැනෙමින්, ඉතාමත් අසරණව, දුම්රිය පාරෙහි පිලි උඩට වැටුනෙමි. දිගින් දිගටම ලේ ගැලීම කරණකොටගෙන, මගේ ශරීරය සීතල වන්නට විය. එවිට මගේ ත්‍රන්සායට, මා දුම්රියක් පැමිණෙනවා දුටුවෙමි! යක්ෂයා මාව මරණ්නට වෑයම් කරමින් සිටියෙහිය,



එහෙත් විස්මපත් ආකාරයට, ස්වාමින්වහන්ස පොලිස්භටයෙක් කරණකොටගෙන, කොඩිය ඔසවා දුම්රිය නතර කළසේක. පොලිස්භාටයා මට දුම්වැටියක් දුන් නමුත්, යම් අමුතු හේතුවක් නිසා මට දැන්, එය අපවිත්‍ර දෙයක් මෙන් දැනිණ. දෙවිතුමණෝ, මාව, මාගේ සියලු දුෂ්ට ක්‍රියාවලින් මුදවා, මට නව ජීවනයක් දුන්සේක. දේවිතුමාණන්ගේ ගැළවීම දෙන්නාවූ කරුණාව කෙතරම් විස්මපත්ද!

ආරෝග්‍යශාලාවට ගෙනගිය පසුත්, අපගේ ජිවිත




බේරාගැනීමට කළ සෑම වෑයමක්ම අසාර්ථක විය. අප සියලුදෙනම මැරෙන්නට අතහැර තිබුණි. ඒ කෙසේ වෙතත්, ස්වාමින්වහන්ස අප පස් දෙනාට යාඥා කරන පිණිස කිතුණු පිරිසක් එවූ බැවින් අප ක්ෂණික සුවය ලබගත්තෙමු. 'යේසුතුමාණන්, ස්වකිය වචනයෙන් ආත්ම දුරුකර, සියලු රෝගින් සුවපත් කළසේක.' 'උන්වහන්සේගේ පහර වලින් අප සුවය ලබා සිටින්නෙමු.' 'දෙවිතුමාණන්ගේ මාර්ග සම්පූර්ණය, අපගේ දැනගැන්ම ඉක්මවා යයි. එතුමාණන් කුඩා ගෙකුරුල්ලා ගැනත් සලකන සේක් නම්, එතුමාණන් වෙතට හැරෙන්නන් ගැන කොතරම් සලකනවා ඇද්ද.'



යේසුකිතුතුමාණන් මගේ ගැලවුම්කරුවානන් සහා වෛද්‍යවරයා විය, ඒ සමගම මගේ 'නීතිවේදියා' බවටද පත්විය. මගේ නඩු විභාගයේදී, මා විනිසුරු ඉදිරියෙහි සිටියේ විත්තිකරුවෙකු නොමැතිවය. සෑම දෙයක්ම මට විරුද්ධව තිබිණ, එහෙත්

දෙවිතුමාණන් විනිසුරුගේ සිත ස්පර්ශ කරමින්, මට වර්ෂ 20කට පමණක් සිරදඬුවම නියමකරන්නට සැලැස්වූසේක. මා කාලාන්තරයක් සිරගෙදර සිටියත්, දෙවිතුමාණන් විස්මපත් ලෙස මා වෙනස් කර බැවින්, මාගේ ආත්මය කුරුල්ලෙකු මෙන් නිදහස්වී තිබිණ. 'පව්කරණ සියල්ලෝම පාපයාගේ වහල්ලුය.' 'එහෙයින් පුත්‍රයා නුඹ නිදහස්කරන්නේ නම් සැබවින් නුඹලා නිදහස් වන්නහුය.'



යේසුතුමන්ව තව තව වැඩියෙන් දැනගැනීමේ ආශාවෙන් මගේ සිත පිරීගියෙහිය, ඒ උදෙසා සිරගෙදර තුලදී මට උපකාර කරණ පිණිස මා දෙවිතුමන්ගෙන් උදක්ම ඉල්ලා සිටියෙමි. සිරකුටියට ඇතුල්වූ පළමු වතාවේදීම, මගේ ඇද යට බලන ලෙස ශුද්ධාත්මයන් වහන්සේ මට පවසන ලදී. මා මවිතකරමින්, මෙට්ටය යට තිබී මට අලුත් බයිබලයක් සම්බ විය. හලේලුයා! මට තිබූ එකම ප්‍රශ්නයනම් මා කියවන්නට ඉගෙනගෙන නොතිබීමයි; එහෙත් සියලු දේ නිසි ලෙස කරන්නාවූ දෙවියන්වහන්ස, මට දිනෙන්, දින උගන්වන්නට විය. දේව වචනය කියවන අතරතුරේදී, යුදෙව් පරිසිවරයෙකු වූ



සාවුල්ද පුදුම පෙරළියක් අත්දුටු ආකාරය මා දුටුවෙමි. අද දින ජනතාව මෙන් ඔහුද, යේසුතුමන් මේසායා වන, දේවපුත්‍රයාණන් බවට විශ්වාස කලේ නැත.


ඔහුගේ ධාර්මික ජ්වලිතකම නිසා,



ඔහුගේ සමකාලීන වූ, බොහෝ
කිතුනුවන්හට වධ දී ඝාතනය කළේය.
එහෙත්, දයානුකම්පාවෙන් පූර්ණවූ
දෙවිතුමාණන්ට, මෙවැනි මනුෂ්‍යයෙකුට
පවා ගැලවීම දීමට හැකිවිය. ඔහුට
ගැලවීම ලැබී, තෙදිනකට පසු සාවුල්
(දැන් පාවුල් ලෙස හැඳින්වෙන) වතුර
බව්තිමය ලබා, දෙවිතුමන් විසින්
ශුදධාත්මයෙන්ද පිරෙවූ බව, මම තවදුරටත් කියෙව්වෙමි.
එබැවින්, මගේ ගැලවිමෙහි, මේ එක් අත්දැකීමක් අඩුවී
තිබූ බැවින්, මට ලැබුණ පළමුවෙනි වතාවේදීම ගිල්වීමේ
බව්තිස්මයට කීකරු වීමට මා කැමති විය.
සිරගෙදෙරදී, මා බොහෝ ආගමික ගුවන්විදුලි
වැඩසටහන්වලට සවන්දී, බොහෝ තැපැල් පාඨමලාවන්ද
හැදැරුවෙමි. නුමුත් මෙම පොත් වලින් ඉගෙන ගැනීම
මාව තව තවත් වික්ෂිප්තභාවයට පත්කලෙහිය. එවිට
දෙවිතුමාණන්, ස්වකීයවචනයෙන් උන්වහන්සේම
මට උගන්වන පිණිස සියලු පොත් පත් විනාශකරණ
ලෙස මට පැවසීය. ‘සැබෑකමේ ආත්මයානන්වහන්සේ
ආ කළ, උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට
මගපෙන්වනසේක.....යමෙකු විසින් නුඹලාට ඉගැන්වීම
ඕනෑකරන්නේ නැත; එම ආලේපය සියල්ල ගැන නුඹලාට
උගන්වන ලෙසද....’ දේවවචනය දිවා රාත්‍රියේ මට ප්‍රීතියක්
බවට පත්විය. දේවවචනය, මට සහනය, ශක්තිය,
අනුශාසනය ගෙන දුන් ප්‍රභවයක් ලෙස, සිරගෙදර මා

ගත කළ කාලය තුලදී, ශුද්ධවූ ජයාන්විත දිවිපෙවතකට මන්පෙන්වුසේක.

කිතුතුමන්ගේ ප්‍රේමයෙන් බලකරනු ලැබ, යේසු කිතුනුවන් සමග එකතුවී, අප අන් සිරකරුවන්ටද සාක්ෂි දරමින්, බයිබල් පංති තබමින්, රෝගීන්ට සුවය උදෙසා යාඥා කිරීමට පටන්ගත්තෙමු. අප බොහෝ පීඩා තුළින්ද , බොහෝ අවස්ථාවන්හිදී  අප ජිවිත තර්ජන කරණු ලැබුනද, අපි අඛන්ඩව යේසුකිතුතුමාණන්ගේ නාමය උසස්කර මහිමයට පත්කළෙමුව.



අවසානයේදී, වසර 13 කට පසු යහපත් හැසිරීම් මත මා නිදහස් කරණු ලැබීය. පේත්‍රුස්තුමා සිරගෙදරින්, නිදහස්වීමෙන් පසු යාඥාකරණ කන්ඩායමක් වෙතට මගපෙන්වනු ලැබුවාසේ,  දෙවිතුමන්ට සේවයකරන පිණිස, තමුන් සන්තක සියලු දේ අත්හැර, යාඥා කරමින් සිටි ස්වකිය ශුද්ධවන්තයන් ස්වල්පයක් වෙතට, ස්වාමින්වහන්සේ මාවද මගපෙන්වුසේක. කෙටිකලකට පසු, මා වෙනුවෙන් කුරුසියේ දිවිපිදු තැනැන්වහන්සේට මගේ මුළු දිවියම භාර කෙළෙමි. ‘ දෙවිතුමන් මා වැනි නොවටින, තැනැත්තෙක් කුමකට තොරාගත්තේද?’, යන්න, නිරතුරුවම, මා තුළ පැණනැගෙන ප්‍රශ්නයක් විය. ‘ නුමුත් දෙවියන්වහන්සේ  ප්‍රඥාවන්තයන් ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ මෝඩ දේවල් තෝරාගත්සේක;  දෙවියන්වහන්සේ ශක්තිමත් දේ

ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ දුර්වල දේවල් තෝරාගත්සේක. ඇත්තාවූ දේවල් නැතිකරන පිණිස නැති දේවල් වැනි ලෝකයේ පහත් දේවල් සුළුකොට සිතනු ලබන දේවල්ද දෙවියන්වහන්සේ තෝරාගත්සේක. එසේ කළේ කොයි මනුෂ්‍යයෙක්වත් දෙවියන්වහන්සේ ඉදිරියෙහි පාරට්ටුකර නොගන්නා පිණිසය.' සැබවින්ම එතුමාණන්ගේ වදන් ඉටු වී ඇත!

මගේ මිත්‍රය, දෙවිතුමාණන්ට මා වැනි පව්කරුවෙකු ගලවන්නට හැකි වුයේ නම්, උන්වහන්සේට ඔබව ගලවන්නට පුළුවන, ඕනෑම කෙනෙකුව ගැළවිමටද හැක. යේසුතුමාණන් කුරුසියේදී සකළ ලොව උදෙසා වැගුරුවූ ඒ ලේ තුළින්, එතුමාණන් වෙතට අවංකව පැමිණෙන ඕනෑම පව්කරුවෙකුව පිරිසිදුකර, මුදවා, ගැළවීමට හැකිය. අද දිනම ඔබගේ ජීවිතය එතුමාට භාර නොකරන්නේ මන්ද? යෙසුතුමන් ඉතා ඉක්මණින් පැමිණෙනසේක! ඒ දිනට සුදානම් වන පිණිස, එතුමාණෝ ඔබහට ශුද්ධ, ජයාන්විත

**ජීවිතයක් ;**

**මුළු ස්වභා දහමේ රාජ්‍යය මාගේ වුවත්**

**එය ඉතා සුළු පඩුරක් වේ;**

**මෙතරම් පුදුම, මෙතරම් දිව්‍යමයවූ ප්‍රේමය,**

**මගේ ජීවිතය, මගේ ආත්මය, මගේ සියල්ල බලෙන්**

**ඉල්ලාසිටියි!**

**මක්නිසාද මාගේ ජිවත්විම නම් ක්‍රිස්තුස්වහන්සේ (උදෙසා) ය, මරණයද මට ලාභයක්ය!'**

ගළවන පිණිස ගැළවීම ලැබුවෙමි, සාමුවෙල් ද්‍රයින්



## යාඥාව:

පියාණෙනි, මාගේ සියලු පාප නිසා මා පසුතැවිලි වෙමි (ඔබගේ සියලු පාප කියා සිටින්න). මට කමාව දී, ඔබවහන්සේගේ, පුත්‍රයාණන් වන යේසුකිතුතුමාණන්ගේ ලේ වලින් මා පිරිසිදු කළ මැනව. ඔබවහන්සේගේ ශුදධාත්මයෙන් මා මුද්‍රා කර, කිතුතුමාගේ ඉක්මන් ඊමට මා සුදානම් කර මැනව; යේසුස්වහන්සේගේ නාමයෙන්. ඔබවහන්සේට, ස්තුති වේවා ස්වාමිනි! ආමෙන්.

## බයිබල් පාඨයන්:

යොහාන් 10:10; රෝම 6:23; රෝම 10:9-13;
යොහාන් 3:3-5; ක්‍රියා 2:1-4; I කොරි. 14:2, 14:18; I පේත්‍රු. 2:24; යොහාන් 8:34,36;
ක්‍රියා 9:1-20; යොහාන් 16:13; I යොහාන් 2:27;
ක්‍රියා 12:1-17; ලූක් 14:26-33; I කොරි. 1:26-29;

